# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE — REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVII — OCTOBER 2023 — Issue No. 11


## කැපී පෙනෙන ක්‍රියාවන් කිරීමට දිව්‍යමය ලෙස ඔබව කැඳවා ඇත.

### YOU ARE DIVINELY SUMMONED TO ACCOMPLISH *EXTRA-ORDINARY* DEEDS!



***Rev. Angeline Selvakumari***

දානියෙල් 11:32 හි සඳහන්ව ඇති ආකාරයට දෙවියන්වහන්සේ අපගේ ජීවිත තුල බලවත්වූ දේ කරන බවට මතක් කර දෙයි.

***''....නුමුත් තමුන්ගේ දෙවියන්වහන්සේ හඳුනන්නෝ වන සෙනඟ බලවත්වී, සමර්ථකම් කරන්නෝය.'' (දානියෙල් 11:32)***

දෙවියන්වහන්සේව හඳුනන්නන් වන උන්වහන්සේගේ සෙනඟ ආත්මික ලෙස පරිනත වෙමින් ඔවුන්ගේ ඇදහිල්ල ක්‍රියාවට දමමින් ඔවුන්ගේ ජීවිතයේදී මුහුණ දෙන සෑම අභියෝගයකටම නිර්භීතව මුහුණදෙනවාට උන්වහන්සේ කැමති වන්නේය.

අප තුළ තිබෙන දේව බලය සුවිශේෂී ඇදහිල්ල තුළ ක්‍රියා කිරීමට නම්, අපගේ ඇදහිල්ල සාමාන්‍ය ආකාරයෙන් පවත්වාගෙන යා නොහැකිය. අපගේ ඇදහිල්ල ප්‍රකාශ විය යුතුයි.

*4 වෙනි පිටුවට ...*

### ශුද්ධවූ බයිබලය

**(හිතෝපදේශ 24:1-10)**

01. දුෂ්ට මනුෂ්‍යයන්ට ඊර්ෂ්‍යා නොකරන්න, ඔවුන් සමඟ සිටීමට ආශා නොවන්න.

02. මක්නිසාද ඔවුන්ගේ සිත නාස්තිකරන්ට කල්පනාකරයි, ඔවුන්ගේ තොල්ද අනතුරුකිරීම ගැන කථාකරයි.

03. ප්‍රඥාවෙන් ගෙයක් ගොඩනගනු ලැබ, නුවණින් එය ස්ථිරවේ.

04. දැනගැන්මෙන්ද එහි කාමර සියලු ආකාර අනර්ඝවූ ප්‍රසන්නවූ වස්තුවලින් පිරෙන්නේය.

05. ප්‍රඥාවත් මනුෂ්‍යයා බලවන්තය; එසේය, දැනගැන්ම ඇති මනුෂ්‍යයා ශක්තිය වැඩිකරගනියි.

06. මක්නිසාද ඥානවන්ත ගුරුකම් පිට නුඹ නුඹේ යුද්ධය කළ යුතුය; මන්ත්‍රීවරුන් රාශියක් ඇති කල්හි ආරක්ෂාව තිබේ.

07. ප්‍රඥාව මෝඩයාට උසස් වැඩිය; දොරටුවේදී ඔහු තමාගේ මුඛය නොහරියි.

08. නපුර කිරීමට උපා යොදන්නාට ප්‍රයෝගකාරයෙකැයි මනුෂ්‍යයෝ කියන්නෝය.

09. මෝඩයාගේ යෝජනාව පාපයය; නින්දාකරන්නාද මනුෂ්‍යයන්ට පිළිකුලක්ය.

10. නුඹ විපත්ති දවසේදී කලකිරෙන්නෙහි නම් නුඹේ ශක්තිය අල්පය.




**Echo of His Call**

*Christian YouTube Channel!*

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!


**English, Hindi, Tamil & Telugu**

Every day – 5.00 A.M.

**Tamil Sunday Service – 8.30 A.M.**

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

REACHING NATIONS



*from your dearly beloved brother...*

# කැඳවීමේ ප්‍රතිරාවය



"දෙවියන්වහන්සේ එක් වරක් කීසේක. මම මෙය දෙවරක් ඇසීමි, එනම් බලය දෙවියන්වහන්සේට අයිති බවත්."

(ගීතාවලිය 62:11)

**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.



Dr. A. Richard Samuel

**ස්වාමීන්වහන්සේ තුළ ප්‍රේමවන්තයෙනි,**

අපගේ ස්වාමීවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අසමසම නාමයෙන් අපි ඔබට සුභ පතමි.

කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ ඉංග්‍රීසි භාෂාවේ උප කර්තෘ වරයාවූ අපගේ ප්‍රිය සහෝදර Dr. A. රිචඩ් සැමුවෙල් M. A. Phd 2023 වන වර්ෂයේ අගෝස්තු මස 30 වන දින ස්වර්ගස්ථ වූ බව ඉතා කණගාටුවෙන් දැනුම් දෙන්නට කැමැත්තෙමි. අප හා සමඟ ඔහු දිගු කාලයක් සේවය කලේය. ඔහුගේ බිරිඳ නිසාත් දරුවන් නිසාත් සහ දරු මුණුබුරන් නිසාත් යාච්ඤා කරන්න.

2 තිමෝති 4:2 ට අනුව, කලටත් අකලටත් අප දෙවියන්වහන්සේගේ සේවය කල යුතුය. එසේම අපගේ සේවයන් විවිධාකාරව තිබේ.

- ★ විවිධ භාෂාවන් වලින් සභාවේ දේව මෙහෙයන් පැවැත්වීම.
- ★ කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ භාෂා 16 කින් මුද්‍රණය කිරීම
- ★ තැපැල් මාර්ගික පාඩම් මාලාව දෙමළ, ඉංග්‍රීසි හා හිංදි යන භාෂාවන් 3 න්ම නිකුත් කිරීම.
- ★ ඉංග්‍රීසි හා දෙමළ භාෂාවන්ගෙන් දුරස්ථ බයිබල් පාඩම් මාලාව පවත්වාගෙන යාම
- ★ හිංදි, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන් ගෙන් බයිබල් පාසැල් තුනක් පවත්වාගෙන යාම
- ★ ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසල පවත්වාගෙන යාම
- ★ කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව භාෂා 16 න්ම මුද්‍රණය කිරීම හා මුද්‍රණාලය පවත්වාගෙන යාම.
- ★ දිළිඳුන්ට උපකාර කිරීමේ සමාජ සංවිධානයක් පවත්වාගෙන යාම
- ★ විවිධ භාෂාවන් වලින් ශුභාරංචි රැස්වීම් මාලාවන් පැවැත්වීම.
- ★ කැඳවීමේ ප්‍රතිරාවය YouTube නාලිකාව හරහා දෙමළ, ඉංග්‍රීසි, තෙලිඟු හා හිංචි භාෂාවන්ගෙන් දේව වචනය බෙදා දීම.

මෙම සේවාවන් තුළින් අපට ඉතා හොඳ ප්‍රතිචාර ලැබේ. එම නිසා සියලු ගෞරවය මහිමය ස්වාමීන්වහන්සේගේ නාමයට පුද කරමි. එසේම අපට යාච්ඤාවෙන් හා මුදල් අතින් උපකාර කරන්නාවූ සියලු දෙනාටම හෘර්දයාංගයම ස්තූතිය පුද කරමු.

## YouTube සේවයේ වර්ධනය

අතීතයේ සිටි ආත්මික පුද්ගලයින්ගේ මතයක් වූයේ, අප සියලු නීවන තාක්ෂණය පාවිච්චි නොකලය යුතුයි කියාය. එනම්, රූපවාහිනිය, අන්තර්ජාලය, ජංගම දුරකථන හා YouTube ආදියයි. අපද එය විශ්වාස කල නමුත් නූතන සාමාන්‍ය මනුෂ්‍යයන් පවා පාරම්පරිකව පැවති දේ එනම්, ගුවන් විදුලිය, පොත්පත්, පුවත්පත් ආදී දේ අත්හැර ඔවුන් සියලු දෙනාම මෙම නීවන තාක්ෂණික මෙවලම් වලට හුරුවී ඇත.

CHIEF EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.

ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager
Dr. Rabinder Boaz, M.S.
Bro. K. Puratchivendan

EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Dr. A. Richard Samuel, M.A., Ph.D.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858

E.mail ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

YOUTUBE CHANNEL
Echo of His Call

Our Ministries: ☼ ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ☼ BIBLECOR - Postal Courses (3 languages) ☼ Media Ministry ☼ Online Courses ☼ Theological Correspondence Courses (2 languages) ☼ Church Planting ☼ Nehemiah Bible Colleges ☼ Gospel Printing Press ☼ Great Commission Partners ☼ St. Paul's Matriculation School ☼ Crusades ☼ Community Development

## ජංගම දුරකථන

අද දරුවන් තරුණ තරුණියන් වැඩිහිටියන් යන සියලු දෙනා ඔවුන්ගේ ආර්ථික තත්වය කුමක්වුවත් සෑම දෙනාටම ජංගම දුරකථන එකක් හෝ එකකට වඩා වැඩි ගණනක් පාවිච්චි කරනු ලබයි. සෑම ජංගම දුරකථනයකටම එකකට වඩා Sim Card ඇතුලත් කර ඇත. අද මුළු ලොව පුරාම මෙවැනි ආකාරයට ජංගම දුරකථන භාවිතා කරයි.

මෙම ජංගම දුරකථන එකම වේලාවේදී බොහෝ අයව සම්බන්ධ කර ගැනීමට පාවිච්චි කරති. තවත් අය මෙය වැරදි ආකාරයට පාවිච්චි කරති. නමුත් අප නූතනයේ ජංගම දුරකථන තුළින් විශාල සෙනඟකට ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ හැකියාව ලැබී ඇත.

සෑම මනුෂ්‍යයෙක්ම ඔහුගේ ජංගම දුරකථනය හරහා ලෝකයේ විවිධ පුවත් වලට ඇහුම්කන් දීමට, විවිධ වූ වැඩසටහන් නැරඹීමට මෙන්ම ශුභාරංචි පණිවිඩ වලට ඇහුම්කන් දීමටද අවස්ථාව ලැබී තිබේ. මුල් කාලයේදී විනාඩි 15 වැනි කාලයකදී රූපවාහිනී නාලිකාව හරහා චිත්‍රපට, ටෙලි නාට්‍ය හා ලෝක පුවත් ආදීදේ තුළින් ශුභාරංචිය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ගෙන තිබුණි. මෙම සේවය තුළින් අපට බොහෝ යහපත් වූ ප්‍රතිචාර සහ ප්‍රතිඵල ලැබුණි. මෙවැනි දේ තුළින් අපගේ සේවයට ලැබූ ආශිර්වාදයන් මිල කිරීමට නොහැකිය.

ජංගම දුරකථනය බොහෝ විට භයානකව තිබේ. නමුත් අපට එය යහපත සඳහා පාවිච්චි කල හැකිය. අපගේ කැඳවීමේ ප්‍රතිරාවය YouTube නාලිකාව හරහා සදාකාලික විනාශයට යන්නාවූ සෙනඟට ක්‍රිස්තුස් යේසුස් වහන්සේගේ ශුභාරංචිය ප්‍රකාශ කිරීමට පාවිච්චි කරමු. සෑම දිනකම උදෑසන 5.00 ට දෙමළ, ඉංග්‍රීසි, හිංදි හා තෙළිඟු භාෂාවන් වලින් ලෝකයේ සිටින්නාවූ මනුෂ්‍යයන්ව විනාශයෙන් මුදවා ගැනීමට අප කෙටි පණිවිඩයක් විකාශනය කරමු. මෙම පණිවිඩයෙන් ඔවුන්ට ඔවුන්ගේ ජීවිතය දෙවියන්වහන්සේට භාර දීමට පුළුවනි. එසේම ස්වාමීන්වහන්සේ තුළ ඔවුන්ගේ ජීවිතය කැපකරමින් දෙවියන්වහන්සේගේ මාර්ගය තුල ගමන් කිරීමට අප මෙම තාක්ෂණය පාවිච්චි කරමු. එම නිසා අද පුද්ගලික ලෙස බොහෝ දෙනෙක් තමාගේ ජීවිතය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ භාරදී උන්වහන්සේ සමඟ ගමන් කරති.

## අප සමහර සාක්ෂි මෙලෙස සඳහන් කරමු.

''මගේ ආත්මික ජීවිතය ඉමහත් වෙහෙසව තිබුණි. ඔබගේ පණිවිඩය ඇසීම තුළින් දෙවියන්වහන්සේ මාව නැවත උන්වහන්සේ වෙතට ලංකරනු ලැබුවා''

''මගේ ජීවිතයේ තිබූ බොහෝ ප්‍රශ්න නිසා මා මගේ ජීවිතය නැති කර ගැනීමට හැදුවෙමි. නමුත් මෙම YouTube නාලිකාවෙන් විකාශය වුනාවූ ඔබගේ යාච්ඤාවෙන් මා දැන් ශක්තිමත්ව ජීවත් වෙයි.''

''මා අසනීප වී ඇඳට වී සිටියෙමි. YouTube නාලිකාව තුලින් ඇසූ දේව වචනය නිසා මා සම්පූර්ණයෙන්ම සුවය ලැබුවෙමි. අප පවුලක් ලෙස ඔබගේ පණිවිඩයට ඇහුම්කන් දෙමු. යාච්ඤාවට සහභාගී වෙමු. එය කරණකොටගෙන අපගේ පවුලේ සමාදානයත්, සුවයත් හා සතුටත් ලැබී ඇත.''

''මා විශ්‍රාමික දේව දාසයෙකි. මා ඔබගේ පණිවිඩය දෙමළ, තෙළිඟු, ඉංග්‍රීසි හා හිංදි භාෂාවන්ගෙන් අසා එය මගේ කණ්ඩායමෙහි සිටින්නාවූ පූර්ණකාලීන කාර්‍යයක් වී ඇත. එය ඉතා හොඳ සේවයකි. ඔබගේ පණිවිඩයෙන් අපට බොහෝ ආශිර්වාද ලැබී තිබේ. එය කරණකොටගෙන ලෝකයේ සිටින්නාවූ බොහෝ දෙනා ආශිර්වාද ලබති. දිගටම මෙම සේවය පවත්වාගෙන යන්න. වසර 55 ක් පුරාවටම ඔබ කලාවූ සේවය මා අගය කරමි. තවත් වසර 50 ක් ඔබගේ සේවය ඉදිරියට කරගෙන යන්නය කියා මා ප්‍රාර්ථනා කරමි.''

''ඔබගේ පණිවිඩයට මා ඇහුම්කන් දීමට පටන්ගත් දින සිට අපි අපගේ සභාවට නොකඩවාම ගොස් නමස්කාර කිරීමට පටන් ගත්තෙමු. තවද ඔබගේ පණිවිඩය කරණකොට ගෙන මගේ පුද්ගලික යාච්ඤාව සහ පවුලේ යාච්ඤාව ඉතා හොඳින්ම කරගෙන යන්නෙමුව.''

මේ ආකාරයට බොහෝ සාක්ෂි හා යහපත් ප්‍රතිචාරයන් අපට ලැබෙමින් තිබේ. මෙවැනි යහපත් වූ සේවයක් උදෙසාම අප මේ YouTube නාලිකාව ආරම්භ කෙරුවෙමු. කරුණාකර මේ සියලුම දේ සඳහා දේව කැමැත්ත ඉටුවෙන්නය කියා යාච්ඤා කරන්න.

මෙම සියලුම සාක්ෂි නිසා අපි දෙවියන්වහන්සේට ස්තුති කරමු. අපි මෙම සේවය තුල ඉමහත් සතුට පත්වෙමු. කරුණාකර ඔබ කැමතිනම්, අපගේ කැඳවීමේ ප්‍රතිරාවය නාලිකාව Subscribe කරන්න. අපගේ ජංගම දුරකථන අංකය නම් +91 98410 71858 වෙයි.

එසේම ඔබට මා හා සමඟ පුද්ගලික ලෙස කථා කිරීමට අවශ්‍ය නම්, මෙම Whatsapp අංක එනම්, +91 98412 71858 භාවිතා කරන්න.

මෙම දුරකථන අංක දෙකම ඔබගේ ජංගම දුරකථනයෙහි Save කරගෙන ඔබගේ අවශ්‍යතාවයේදී අපට කථා කරන්න. ඔබ හා සමඟ සහභාගීකම් පැවැත්වීමට අප කැමැත්තෙමු. අප ඔබ සැමදෙනා ගැනම යාච්ඤා කරමු. අප ඔබගේ යෝජනාවන් අගය කරමු. මෙම සේවය ඉදිරියටම පවත්වාගෙන යන පිණිසත් මෙම සේවය දියුණු කරන පිණිසත් ඔබගේ අදහස් හා යෝජනාවන් තිබේ නම් අපට පවසන්න.

අද බොහෝ දේව දාසයින්ට මෙන් අපටද ආත්මික ලෙස බොහෝ සටන් හා අභියෝගයන් තිබේ. තවත් සමහර අය ශාරීරික ලෙස රෝගිව දුර්වලව සිටී. මේ සෑම දෙනා උදෙසාම යාච්ඤා කරන්නය කියා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමි. දෙවියන්වහන්සේ ඔබව නිතරම ආරක්සා කරන්නය කියා අප ඔබ උදෙසා යාච්ඤා කරන්නෙමුව. ස්වාමීන්වහන්සේගේ කරුණාව නිතරම ඔබ සමග වේවා. ආමේන් !

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

පාස්ටර් සෑම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සෑම්සන් සෑම්

(+91) 98412 71858 / 98410 71858,

E.mail : samselvaraj333@gmail.com

1 පිටුවෙන්....

ක්‍රියා 1:8 හි මෙසේ සඳහන් කරයි. ***''ඔබ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය ලැබූ කල්හි ඔබට උන්වහන්සේගේ සාක්ෂිකාරයෙක් වීමට බලය ලැබෙයි. එවිට ඔබගේ ඇදහිල්ල සෑම අවස්ථාවකදීම ප්‍රකාශ කල හැකිය.''*** යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයින්ගේ ජීවිත දෙස බලන විටදී ඔවුන් තුළ සිදුවූ වෙනස්වීම අප හොඳාකාරයෙන්ම දනී. ඔවුන්ගේ ජීවිත තුලට ශුද්ධාත්මයාණන්වහන්සේ පැමිණීමට පෙර හා උන්වහන්සේ පැමිණීමට පසු ඔවුන් ක්‍රියා කරනු ලැබුයේ කෙසේද කියා ඔවුන්ම දනී. යේසුස් වහන්සේව හඳුනන්නේ නැත කියා තුන් වතාවක්ම ප්‍රකාශ කලාව පේතෘස් ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආලේපය ලැබූ පසු දහස් ගණන් සෙනඟට ශුභාරංචිය ප්‍රකාශකරනු ලැබීය. මෙම බලය ඔහුට ලැබුනේ කොහෙන්ද? එම බලය ඔහුට ලැබුනේ ඔහු තුළ ක්‍රියාකරන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය තුලිනි.

ක්‍රියා පොතේ 3 වන පරිච්ඡේදයෙහි සඳහන්ව ඇති ආකාරයට සාමාන්‍ය පුද්ගලයින් වෙතට ශුද්ධාත්මයාණන්වහන්සේ පැමිණිකල ඔවුන් සුවිශේෂී වූ පුද්ගලයින් වූයේ කෙසේද? කියා සඳහන් කරනු ලබයි. මෙම සාමාන්‍ය පුද්ගලයින් සුවිශේෂී ඇදහිල්ලකින් ක්‍රියා කලේ කෙසේද? මෙයින් අපට පෙනෙන්නේ අපගේ ඇදහිල්ල ක්‍රියාවට දැමූ විටදී බලවත් වූ දේවල් සිදුවන බවයි. ගෝලයින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ලැබූ විටදී ඔවුන්ගේ ඇදහිල්ල කරණකොටගෙන මෙම පළමු හාස්කම සිදුකරනු ලැබීය.

## ක්‍රියා 3 වන පරිච්ඡේදය : පේතෘස් සහ යොහාන්

අපි මෙම පරිච්ඡේදය තුළින් සොයා බලමු.

මෙහි සඳහන්ව ඇති ආකාරයට පේතෘස් සහ යොහාන්ටත්, එම කොරවූ මනුෂ්‍යයාටත් එම දවස සාමාන්‍ය වූ දිනයකි.

මේ තිදෙනාම ඔවුන්ගේ දිනපතා වැඩසටහනට අනුව සූදානම් වී ක්‍රියා කරනු ලැබීය. පේතෘස් සහ යොහාන් සූදානම්වී දෙවියන්වහන්සේට නමස්කාර කරන පිණිස දේව මාළිගාවට ගියෝය. කොරව සිටි මනුෂ්‍යයා තමා ජීවනෝපාය සඳහා සුපුරුදු පදදි දේව මාළිගාවේ දොරටුව වෙතට ගියේය. ඔවුන් උදෙසා දෙවියන්වහන්සේ කුමක් කරන්නට යන්නේද කියා ඔවුන් තිදෙනාම දැන සිටියේ නැත. එම දවස ඔවුන්ගේ ජීවිත තුළ වෙනසක් ඇති කරන්නාවූ දවසක්ය කියා ඔවුන් සිතුවේවත් නැතිව ඇත.

### කථාවේ පසුබිම :

පේතෘස් සහ යොහාන් පුරුද්දක් ලෙස දේව මාළිගාවට ගියෝය. නමුත් තවත් එක්තරා දිනක් ඔවුන් මේ දේව මාළිගාවේ දොරටුව අසල සිඟමන් යදිමින් සිටි කොර මනුෂ්‍යයාව දුටුවෝය.ඔහු මෙම ස්ථානයෙහි වසර 40 ක් පුරා සිඟමන් අයදිමින් සිටි පුද්ගලයෙකි. එම පළාතෙහි සිටි යුදෙව්වරුන්ට ඔහු ඉතා හුරු පුරුදු වූ පුද්ගලයෙකු විය හැකිය. සමහරු ඔහුව නොසලකා හරින ලද අතර තවත් අය ඔහුට මුදල් දෙන්නට ඇත.

මෙම දේව මාළිගාවෙන් පිටත දොරටුව අසල ඔහු දශක 4 ක් ගතකරනු ලැබුවේය. එම දේව මාළිගාවේ තිබූ චාරිත්‍ර, වාරිත්‍ර හා පුරුදු ගැන ඔහුගෙන් ඇසූ විට ඒවා ගැනත්, දේවස්ථානයට පැමිණි සියලු දෙනා ගැනම පැවසීමට ඔහුට හැකියාවක් තිබෙන්නට ඇත. දේව ගෘහයේ සිටි නායකයින්, ගැන දැන සිටි අතර ගායනා කරනු ලැබූ සියලු ගීතිකා නායකයින්, ගැන දැන සිටි අතර ගායනා කරනු ලැබූ සියලු ගීතිකා ඔහු දැන සිටින්නට ඇත. මන්ද වසර 40 ක් පුරාවටම දේශනාවන් වලට ඇහුම්කන් දී තිබූ නමුත් ඔහු සිටියේ දේව මාළිගාවෙන් පිටතය. ඔහුව දේව මාළිගාවේ ඇතුලට ගෙන යාමට කිසිවෙක් සිටියේ නැත.

අප අතර සිටින්නාවූ සමහර දෙනාද මෙවැනි ආකාරය. දෙවියන්වහන්සේ කවුද කියා අපි දනිමු. උන්වහන්සේ ගැන සෑම කාරණාවක්ම අපි දනිමු. උන්වහන්සේගේ ආශ්චර්යමත් ක්‍රියා උන්වහන්සේගේ හාස්කමේ බලත් අපි දනිමු. බොහෝ දේශනාවන් අප අසා ඇති අතර බොහෝ ගීතිකාද ගායනා කරමු. එහෙත් අපි සිටින්නේ, අපි ජීවත් වෙන්නේ තවමත් දේව අභිමුඛත්වයෙන් පිටතය. දෙවියන්වහන්සේ සමඟ අපට පුද්ගලික සම්බන්ධතාවයක් නැත. අප මේ ආකාරයෙන් ජීවත් වුවත් ද අපගේ ජීවිතය කොහොමද? ක්‍රිස්තුස්වහන්සේ සමඟ ඔබගේ ගමන් කිරීම කෙසේද?

6 වෙනි පිටුවට....

NEHEMIAH BIBLE
RESIDENTIAL / EVENING COLLEGE,
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
Registered Candidate for Membership
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders & Senior Pastors for the past 54 years
Diploma in Ministry : One year
Diploma in Theology : Two years
Bachelor of Theology : Three years
Qualification : 10th Standard & above
Rush for Admission!
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ඔක්:19-** වර්ෂ 1969 සිට කැපවීමෙන් පවත්වාගෙන ආ කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:20-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය තුළින් නොගැලවුන සෙනඟ ගැලවීමට ගෙන ඒම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:21-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ 55 වන වාර්ශික සම්මේලනය ඉදිරි දිනක පැවැත්වීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:22-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ පසුගිය මාසයේ ප්‍රගතිය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:23-** භාෂා 16 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:24-** යාච්ඤා මැදිහත්කරුවන්, මහා ආඥාවේ මැදිහත්කරුවන් ඇතුළු අනෙක් සේවකයන් සහ ඔවුන්ගේ පවුල් වල අයට ස්වාමීන්වහන්සේගේ කරුණාව ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:25-** දේවධර්ම පාඨමාලා වල වර්ධනය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:26-** කැඳවීමේ ප්‍රතිරාවය සහකාර කතෘවරුන් සහ ඔවුන්ගේ පවුල් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:27-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සේවක පවුල් වල ආරක්ෂාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:28-** සභා පාළක සෑම් සෙල්වරාජ්ගේ කැපවුන සේවය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:29-** සියලු ජාතීන්ගේ ආරක්ෂාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:30-** කැඳවීමේ ප්‍රතිරාවය සේවය තුළින් වෙනත් සේවාවන්ට උපකාර කිරීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:31-** සේවයට උපකාර කරන සැමදෙනා ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**නොවැ:01-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහල සහ නෙහෙමියා බයිබල් විදුහල ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**නොවැ:02-** බයිබලය සහ වෙනත් දේවධර්ම පොත් මුද්‍රණය කිරීම සඳහා කැපවී සිටින ආයතනය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**නොවැ:03-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**නොවැ:04-** නෙහෙමියා බයිබල් විදුහලේ නේවාසික සිසුන්ගේ විනය සහ කැපවීම ගැන යාච්ඤා කරන්න

**නොවැ:05-** කිතුණු ඇදහිලිවතුන්ගේ සුභසාධනය ගැන යාච්ඤා කරන්න

**නොවැ:06-** තරුණ ප්‍රජාව මත්ද්‍රව්‍ය වලට හසුනොවී සිටීමට හැකියාව ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**නොවැ:07-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සහකාර කතෘවරුන් ගැන යාච්ඤා කරන්න

**නොවැ:08-** දේව සේවයේ යෙදී සිටින සියලු සේවකයන් ගැන යාච්ඤා කරන්න

**නොවැ:09-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ ජීවිත කථාව ලිවීම ධෛර්යමත් වන පිනිස යාච්ඤා කරන්න

**නොවැ:10-** ලෝක සාමය උදෙසා යාච්ඤා කරන්න

**නොවැ:11-** සෑම මනුෂ්‍යයෙකුටම යහපත් හැසිරීම සහ ආරක්ෂාව ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**නොවැ:12-** නොගැලවුන සෙනඟ ස්පර්ශ කරන පිනිස යාච්ඤා කරන්න

**නොවැ:13-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ සැම උදෙසා යාච්ඥා කරන්න

**නොවැ:14-** දේශයේ දරුවන් ගැන යාච්ඤා කරන්න

**නොවැ:15-** කිතුණු නිකායන් ස්පර්ශ වන පිනිස යාච්ඤා කරන්න

**නොවැ:16-** ස්වභාවික විපත්ති වලින් ලෝකයේ ජනතාව ආරක්ෂා වන පිනිස යාච්ඤා කරන්න

**නොවැ:17-** නැවත කොවිඩ් වෛරසය ලෝකයේ පැතිර නොයන පිනිස යාච්ඤා කරන්න

**නොවැ:18-** සෑම කිතුණු සේවයක්ම පුදුම ලකුණු හාස්කම් වලින් බලවත් වන පිනිස යාච්ඤා කරන්න

*4 පිටුවෙන්....*

ඔබ ජීවත්වෙන්නේ උන්වහන්සේගේ අභිමුඛත්වයෙන් පිටත හෝ උන්වහන්සේගේ අභිමුඛත්වය තුලද?

ඔබ දේව අභිමුඛත්වයෙන් ඉතා ඈත්ව සිටිනවාද? මේ පණිවිඩය තුළින් ඔබව දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයට ලං කරන්නට කියා මං යාච්ඤා කරමි.

මෙම කොර මනුෂ්‍යයාත් සුපරුදු පරිදි එදිනද තමාට මුදලක් ලැබේය කියා පේතෘස් සහ යොහාන් දෙස බැලුවේය. එවිට පේතෘස් ඔහු දෙස බලා 'අප දෙස බලන්න' ය කියා පවසනු ලැබීය. පේතෘස් ඔහුට තමාගේ ඇස් දෙස බලන්නය කියා පවසනු ලැබුවේ ඇයි? එයට හේතුව නම් මෙම කොර වූ මනුෂ්‍යයා ඔහුගේ මුළු අවධානයට පේතෘස් දෙස තබා ඔහු දෙස බලන්නය කියා පවසනු ලැබීය. පේතෘස් ඔහුගේ ඇදහිල්ල ක්‍රියාවට දැමීමට පටන්ගත්තේය.

ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුලට පැමිණෙන විටදී අප සාමාන්‍ය පුද්ගලයෙක් නොව අප අසාමාන්‍ය පුද්ගලයෙක් වී ස්වාමීන්වහන්සේ තුළ බලවත් ක්‍රියා කරන්නාවූ අය වෙමු. ඔහුගේ ඇදහිල්ල දැන් ක්‍රියා කිරීමට පටන්ගත්තේය. දෙවියන්වහන්සේ අපගෙන්ද බලාපොරොත්තු වන්නේ සුවිශේෂී ඇදහිල්ලකි.

## 1. සුවිශේෂී ඇදහිල්ලට සුවිශේෂී දර්ශනයක් තිබිය යුතුය. නොදකින දේ දැකිය යුතුය.

පේතෘස් මෙම පුද්ගලයාගේ ශාරීරික තත්වය දුටුවේය. ඔහු ශාරීරිකව අභියෝගයක් තිබූ පුද්ගලයෙක්ව, සිඟමන් යදින්නාවූ පුද්ගලයෙක්ව, මුදල් අවශ්‍යතාවයන් සපුරා ගැනීමට නොහැකි වූ සහ ඔහුගේ දෛනික අවශ්‍යතා උදෙසා යම් කෙනෙකු යැවීමටද සිදුවිය. මෙම පුද්ගලයා දෙස බලා ඔහුට යම් මුදලක් දී නමස්කාර කරන පිණිස දේව මාළිගාව තුලට යාමට පේතෘස්ව තිබූ නමුත් ඔහු මෙම පුද්ගලයා සමඟ ටික මොහොතක් ගත කිරීමට තීරණය කලේය. පේතෘස්ට දේව මාළිගාවට ඇතුලු වීමේ අවශ්‍යතාවය දැඩිව තිබුනත් ඔහු එම කොරවූ මනුෂ්‍යයා සමඟ ටික මොහොතක් ගත කිරීමට තීරණය කලේය. අප වටා සිටින දැඩි අවශ්‍යතාවයෙන් සිටින්නාවූ මනුෂ්‍යයන්ට දීමට අපට වේලාවක් තිබේද? එසේ නොමැතිනම් වෙනත් දේවල් උදෙසා කාලය ගත කරමින් අප කාර්ය බහුල වී සිටිනවාද? අප අතර සිටින්නාවූ සමහර පුද්ගලයින් තමාගේ දේ පමණක් සොයා බලමින් ජීවත් වෙති. අන් අයගේ අවශ්‍යතාවයන් ගැන සොයා බලා ක්‍රියා කිරීමට අපට කල වේලාවක් නොමැත.

මෙම අවස්ථාවේදී පේතෘස් එහි නතර විය. ඔහු දේව මාලිගාවට ඇතුල් නොවී එක් මනුෂ්‍යයෙකු උදෙසා නතර විය. ඔහු මෙය ඔහුගේ ස්වාමීවූ යේසුස් වහන්සේගෙන් ඉගෙන ගත්තේය. ඔහු එකම එක මනුෂ්‍යයෙකු උදෙසා නතර විය.

අත්තික්කා ගස උඩ සිටි සාකේවුස් උදෙසා යේසුස් වහන්සේ නතර විය. වසර 12 ක් පුරා ලේ මහලේ රෝගයෙන් පීඩා විඳි එම රෝගී ස්ත්‍රිය නිසා උන්වහන්සේ නතර විය. ළිඳ ලග සිටි කාන්තාව මුණ ගැසීමට යේසුස් වහන්සේ එම ළිඳ ලගට ගියේය. දෙසපොලිසයේ සිටි මනුෂ්‍යයාව මුණගැසීමට පිණිස තද කුණාටු මැදින් ස්වාමීන්වහන්සේ එම ස්ථානයට ගියේය. පේතෘස් එක් මනුෂ්‍යයෙක් ගැන තිබූ වැදගත්භාවය මෙහිදී තේරුම්ගන්නට ඇත. අප මොහොතක් සිතමු. එක් මනුෂ්‍යයෙක් දිනා ගැනීම පිණිස අප අපගේ කාලය දුන්නේ කවදාද? අප එක් මනුෂ්‍යයෙකුට ප්‍රේමය, කරුණාව දක්වමින් සැලකුවේ කවදාද?

පේතෘස් මෙම මනුෂ්‍යාගේ ශාරීරික අවශ්‍යතාවයන්ට වඩා ආත්මික නිදහස දෙස බැලුවේය. පේතෘස් කොරවූ මනුෂ්‍යයාට කථා කොට අප දෙස බලන්නය කියා පැවසීය. එවිට ඔහු ඔවුන් දෙස හොඳින් බැලුවේය. අද අපට මනුෂ්‍යයන්ගේ ශාරීරික අවශ්‍යතා වලට වඩා ආත්මික අවශ්‍යතා දකින නමුත් බොහෝ අවස්ථාවන් වලදී අප අන් අයව විනිශ්චය කරමින්, පවසන්නේ, 'ඔහු ඇහුම්කන් දෙන්නේ නැහැ. කාටවත් ඔහුට කථා කිරීමට බැහැ' කියමින් විනිශ්චය කරනු ලබයි. අප කාටද කථා කල යුත්තේ කියා අපම තීරණය කරනු ලබයි. කෙනෙකුගේ පිටස්තරභාවය දෙස බලමින් අප ඔහුට දෙවියන්වහන්සේව ඕනද? දෙවියන්වහන්සේ ඕන නැද්ද? කියා තීරණය කරයි.

අපගේ සුවිශේෂී ඇදහිල්ල පාවිච්චි කිරීමට අවශ්‍ය නම්, අපගේ දර්ශනයද සුවිශේෂී විය යුතුය. අපගේ පියවි ඇසින් දකින්නාවූ දෙයට වඩා එහා අපි දැකිය යුතුය.

මෙම කොරවූ මනුෂ්‍යයා සුවයක් බලාපොරොත්තු වූයේ නැත. වෙනත් සුව කිරීමේ දේව මෙහෙයක් පැවැත්වූවේද නැත. ඒ සියල්ලම වෙනස්වූයේ ඔවුන්ගේ සුවිශේෂී ඇදහිල්ල තුළින් හා එම ඇදහිල්ල ක්‍රියාවට දැමූ නිසාවෙනි. ඔබත් ඔබගේ සුවිශේෂී ඇදහිල්ල ක්‍රියාවට දැමීමට කැමතිද?

ඔබ දකින දැක්ම වෙනස් කිරීමට කැමතිද? ඔබ කලින් දුටු මනුෂ්‍යයන් වෙනස් වූ ආකාරයෙන් දැකීමට කැමතිද? ඔබගේ සභාවේ අයව ඔබ දකින ආකාරයට වඩා ඇදහිල්ලෙන් උතුම් දර්ශනයක් ඇතිව දකිනවාද?

බර්ණබස්, සාවුල් සහ යොහාන් මාර්ක් යන දෙදෙනාව දුටු විට ඔහු ඔවුන් තුළින් දුටුවේ දෙවියන්වහන්සේ අනාගතයේදී ඔවුන් තුළ කරන්නට යන්නාවූ දේ පිළිබඳවය. අද අප යම් කෙනෙක්ව දුටු විටදී ඔවුන් තුල ඉදිරියේදී සිදු වීමට යන්නාවූ ආත්මික වෙනස දෙස බැලීමට අපට පුළුවන්ද? එවැනි වූ සුවිශේෂී දර්ශනයක් අපට තිබෙනවාද?

## 2. සුවිශේෂී ඇදහිල්ල සුවිශේෂී බලයක් ගෙන දෙයි.

අද බොහෝ දෙනෙක් තමාගේම පහසුකම් තුල ආරක්ෂා සහිතව ජීවත් වෙමින් තමාගේ එදිනෙදා ජීවිතයේ සුපුරුදු ක්‍රියාවන් කරමින් ජීවත් වීමට කැමතිය. අප අතර සිටින්නාවූ බහුතරක් අය ඔවුන් වයසට යනවාත් සමගම ඔවුන්ගේ ජීවිතයේ මෙතෙක් කල සුවිශේෂී ක්‍රියාවන් ඉදිරියටත් කරන්නේ නැත. මගේ ජීවිතයේත් එසේමය. මා කලින් ක්‍රියා කල ආකාරයට දැන් ක්‍රියා නොකරන්නේ ඇයි? මා අභියෝගයන් භාර නොගන්නේ ඇයි? කියා මා මාගෙන්ම ප්‍රශ්නයක් අසමි. අද හැම කෙනෙක්ම ආරක්ෂා සහිතව තමාව ආරක්ෂා කරගෙන ජීවත් වීමට කැමතිය. මාද එවැනිම වූ කෙනෙකි.

අද බොහෝ අය කරනවාක් මෙන් පේතෘස්ටද යොහාන් හා සමඟ එකතු වී මෙම මනුෂ්‍යයාව නොසලකා හැරීමට හැකියාව තිබුණි. නමුත් ඔවුන් නිර්භීතව ධෛර්‍යමත් ලෙස පියවරක් ගෙන 'රන් රිදී මට නැත නමුත් මා ළඟ තිබෙන දේ නුඹට දෙමි' යි කියා පවසනු ලැබීය.

මෙය ධෛර්‍යමත් ක්‍රියාවක් නොවේ, නමුත් මෙය සුවිශේෂී ධෛර්‍යමත් ක්‍රියාවකි. පේතෘස් මෙම මනුෂ්‍යයා තුලට ඇදහිල්ල ඇති කරනු ලැබීය. ක්‍රියා 14:8 - 19 දක්වා ඇති කොටසෙහි කියා ඇති පරිදි පේතෘස් එම කොර වූ මනුෂ්‍යයාට සුවය ගෙන දුන්නේය. පේතෘස්ගේ ඇදහිල්ල තුළින් ඔහුට සුවය ලබා දුන්නේය. නමුත් පේතෘස් සුව කලාවූ මේ මනුෂ්‍යයාට ඇදහිල්ලක් තිබුණද කියා දේව වචනයෙහි සඳහන්ව නැත. නමුත් පේතෘස් හා යොහාන්ගේ ඇදහිල්ල තුළින් මෙම මනුෂ්‍යයාට සුවය ලබා දුන්නේය.

දෙවියන්වහන්සේ අපව කැඳවා තිබෙන්නේ අප වටා සිටින්නාවූ මනුෂ්‍යයන්ට අප තුළ තිබෙන්නාවූ ඇහිල්ල දෙන පිණිසය. බොහෝ අවස්ථාවන් වලදී අප ඇදහිල්ල ගැන හා කථාකිරීමට කැමති වන්නේ ඇදහිල්ල ගැන දන්නාවූ අයටම පමණි. නමුත් අප නිතරම සොයා බැලිය යුත්තේ අප තුළ තිබෙන්නාවූ ඇදහිල්ල ඔවුන් තුල ඇති කිරීමයි.

ප්‍රිය මිත්‍රවරුනි, අප තුල තිබෙන්නාවූ ඇදහිල්ල අප වටා සිටින්නාවූ අය තුලට ඇතුල් කරමින් ඔවුන්ව දෙවියන්වහන්සේ තුලට ගෙන ඒමට කාලය දැන් පැමිණ තිබේ. අප මේ කාලය තුලදී ඇදහිල්ල තවත් කෙනෙකුගේ ජීවිතය තුල වැපිරීමට තීරණය කරමු.

පේතෘස් තුල තිබුණාවූ නොසැලෙන්නාවූ ඒ ඇදහිල්ල කරණකොට ගෙන ඔහුගේ බලය ඔහු ක්‍රියාවට දැමුවේය. මෙම කොරවූ පුද්ගලයා සුවය නොලබයිද කියන සැකය ඔහුගේ හදවත තුළ තිබුනේ නැත. පේතෘස් මහත් වූ ඇදහිල්ලක් ඇතිව 'නැගිට ඇවිදින්න' ය කියා පවසනු ලැබීය. නමුත් මෙම මනුෂ්‍යයාට පේතෘස් පැවසූ දෙය තේරුම් ගැනීමට නොහැකි විය. එම නිසා පේතෘස් ඔහුගේ අතින් අල්ලා ඔහුව නැගිටුවනු ලැබුවේ ඔහුට නැගී සිටීමට බැරි බව ඔහු දැනගෙන සිටි නිසාය.

'දැන් නැගිට ඇවිදින්න' ය කියා පේතෘස් පැවසීය.

තවත් කෙනෙක් පැමිණ තමාව ඔසවයි කියා බලා සිටින්නාවූ බොහෝ මනුෂ්‍යයන් අද සිටිති. තව කෙනෙක් අත දිගුකර ඔවුන්ට සහය දිය යුතුය. බොහෝ අය දේව අභිමුඛත්වයට ලංවී සිටිනවාය කියා සිතන නමුත් ඔවුන් සිටින්නේ දේව අභිමුඛත්වයෙන් පිටතය. ඔවුන්ව ඇතුලට ගෙන යාමට සුවිශේෂී ඇදහිල්ලක් ඇති අය හා සුවිශේෂී ඇදහිල්ලක් ඇති අය අවශ්‍ය වෙයි.

පේතෘස් හා යොහාන් මෙම කොරවූ මනුෂ්‍යයාට බාධාවක් නොවී ඔහුට ආශිර්වාදයක් වෙමින් ඔවුන් තුල තිබූ ඇදහිල්ල හා බලය තුළින් යේසුස් වහන්සේගේ බලය ඔහුට ප්‍රකාශ කරනු ලැබීය.

සෑම කිතුණුවෙකුටම තමාගේ ඇදහිල්ලේ ගමන තුල තනි නොවී දෙවියන්වහන්සේ දුන් ඇදහිල්ල හා බලය අන් අය සමඟ බෙදාගනිමින් ජීවත් විය යුතුය. දෙවියන්වහන්සේ සමඟ පුද්ගලිකව කාලය ගතකරමින්

**URGENT**

We need about 1000 Hindi Christian Books for our Nehemiah Bible Colleges. Please inform us the possibility of procuring the theological Hindi books.

– Pr. S. Sam Selva Raj, Editor
+91-98412 71858

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## "...කියවන්නා තේරුම් ගනීවා...." *(මතෙව් 24:15)*

### දෙවියන්වහන්සේ තම පොරොන්දු ඉෂ්ඨ කරන්නාවූ දෙවියන්වහන්සේය !

### THE LORD WHO KEEPS HIS PROMISES!

1969 වන වර්ෂයේදී මෙම අනර්ඝවූ සේවයට ස්වාමීන්වහන්සේ මාව කැඳෙව්වේය. එසේම 1971 වන වර්ෂයේදී උන්වහන්සේ යෙරෙමියා 51:21-23 දක්වා ඇති කොටස තුළින්ද උන්වහන්සේ මා හට පොරොන්දුවක් දුන්නේය.

***''නුඹ මාගේ යුද්ධ කෙටේරිය හා යුද්ධායුධය. මම නුඹ ලවා ජාතීන් පොඩිකරවා, රාජ්‍යයන් නටබුන් කරවන්නෙමි.''***

***නුඹ ලවා අශ්වයාත් ඌ පිට නගින්නාත් පොඩිකරවන්නෙමි,***
***නුඹ ලවා ස්ත්‍රීය සහ පුරුෂයාත් පොඩි කරවන්නෙමි. නුඹ ලවා මහල්ලා සහ බාලයාත් පොඩි කරවන්නෙමි. නුඹ ලවා තරුණයා සහ කන්‍යාවත් පොඩි කරවන්නෙමි.***

***නුඹ ලවා එඬේරා සහ ඔහුගේ රැළත් පොඩි කරවන්නෙමි. නුඹ ලවා ගොවියා සහ ඔහුගේ ගොන් බානත් පොඩි කරවන්නෙමි. නුඹ ලවා ආණ්ඩුකාරයන් සහ මුලාදෑනීන්ද පොඩි කරවන්නෙමි.''***

මෙම පොරොන්දු මාගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සෑම අංශයකදීම ඉෂ්ඨ විය. අපගේ ස්වාමිවූ දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පොරොන්දු ඉෂ්ඨ කිරීමට ඉතාම විශ්වාසවන්තයි.

දෙවියන්වහන්සේගේ වචනය තුල ඇති පොරොන්දු ඉෂ්ඨ වී ඇති ආකාරය දෙස අප ටිකක් බලමු. ***''නුඹ මාගේ ශුද්ධ කෙටේරිය හා යුද්ධායුධය... නුඹ ලවා ආණ්ඩුකාරයන් සහ මුලාදෑනීන්ද පොඩි කරවන්නෙමි.'' (යෙරෙමියා 51:0-23)***

1978 සහ 1980 යන වර්ෂයන් වලදී මා රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින විටදී රාජ්‍ය සේවකයින් සඳහා වෙන්කර තිබූ නිල නිවාසයන් වල ජීවත්වුවෙමි. එම

***''නුඹට විරුද්ධව සාදන කිසිම ආයුධයක් සඵල නොවන්නේය...'' (යෙසායා 54:17)***

කාලවකවානුවේදී එම ප්‍රදේශයෙහි සේවය කලාවූ රාජ්‍ය සේවකයින් උදෙසාත් තවත් උසස් නිළධාරීන් උදෙසාත් දේව වචනය බෙදා දීමේ අදහසින් විශාල උඩුමහල් ශාලාවක් කුලියට ගත්තෙමි.

තවද මා හට අවස්ථාවක් ලැබෙන්නාවූ සෑම විටෙකදීම එළිමහන් රැස්වීම් පැවැත්වුවෙමි. කෙසේ වෙතත් සමහර අය මෙම රැස්වීම් සේවයට අකමැති නිසා මා හට බොහෝ කරදර කලේය. ඔවුන් මට බණවැදී තර්ජන කලේය. මගේ රැස්වීම් වලට සහභාගී වූ සෙනඟ වටකර ඔවුන්ට හිරිහැර කලේය. කඩු හා කිනිසි අතැතිව යතුරු පැදි වලින් පැමිණ තර්ජනය කලෝය. පුද්ගලික ලෙස මට පහර දුන්නේය. තවද මට කුලියට දී තිබූ ශාලාව නැවතත් මට නොදෙන පිණිස එම හිමිකරුට තර්ජනය කලේය.

මෙවැනි දරුණු බාධා හා පරීක්ෂාවන් මධ්‍යයේදී දෙවියන්වහන්සේ මාව තනිකලේ නැත. මේ සියල්ලේදී උන්වහන්සේගේ බලවත්වූ හස්තය මා හා සමඟ තිබුණි. මා ස්වාමීන්වහන්සේට යාච්ඤා කලෙමි. මට විරුද්ධව පැමිණි සියලු දෙනාටම සමාව දෙන්න කියා මා දෙවියන්වහන්සේට යාච්ඤා කලෙමි. ස්වාමීන්වහන්සේ මාගේ යාච්ඤාව අසා මේ මිනිසුන් තුල තිබූ දැඩි සිත් කඩා දමා බොහෝ දෙනෙක්ව ගැලවීමට ගෙන ආවේය. උන්වහන්සේ සෑම කරදරයෙන්ම මාව මුදවා ගත්තේය.

ගීතාවලිය පොතෙහි මෙසේ සඳහන් කරයි. ***''ස්වාමීන් යහපත් බව රස බලා දැනගනිව්. උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන මනුෂ්‍යයා ආශිර්වාදලද්දේය.'' (ගීතාවලිය 34:8)***

*******

තමාට දෙවියන්වහන්සේ දුන් කාල වේලාව අන් අයගේ ජීවිතයේ ශුභ සිද්ධිය සඳහා පාවිච්චි කල යුතුය. තවත් කෙනෙකුගේ ජීවිතයට සුවිශේෂී බලය පාවිච්චි කරමින් ඇදහිල්ලෙන් යුතුව යේසුස් වහන්සේගේ ජීවමානවූ වචනය ඔවුන්ගේ ජීවිත වලට කථාකල යුතුයි. ඔබත් සමඟ සිටින්නාවූ අයට හැකි තරම් ඇදහිල්ලේ වචනත් දේව බලයත් ප්‍රකාශ කරන්න.

## 3. සුවිශේෂී ඇදහිල්ල ආසාමාන්‍ය අභියෝගයන් ගෙන දෙයි.

අපගේ ඇදහිල්ල ස්ථිර නම්, ඒ ඇදහිල්ල සුවිශේෂී වූ දේ ක්‍රියාත්මක කිරීමට මඟපෙන්වන අතර එය අසාමාන්‍ය අභියෝග වලට මුහුණ දීමට සලස්වයි. කිතුණු ගමන සෑම විටම අභියෝග වලට මුහුණදෙන්නාවූ ජීවිතයකි. තවද

## PLEASE PRAY FOR OUR MINISTRIES AT THE HEAD QUARTERS

1. Prayer Service : 24 hours
2. **BIBLECOR** - Bible Correspondence Courses : English, Tamil & Hindi
3. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 8.30 a.m. & 4.00 p.m. Sunday
13. **Tamil Services : 8.00 a.m. & 10.00 a.m. Sunday**
14. **Hindi Service : 4.00 p.m. Sunday**
15. **Telugu Service : 5.00 p.m. Sunday**
16. **English & Tamil Service : 6.00 p.m. Sunday**
17. Women's Prayer : 5.30 p.m. Wednesday
18. Men's Prayer : 7.00 p.m. Friday
19. Discipleship Meeting : 6.00 p.m. Saturday
20. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
21. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
22. Ministers Review Meeting : 5.30 p.m. First Saturday
23. Parents' Prayer : 4.00 p.m. First Sunday
24. Night Prayer : 9.30 p.m. Second Friday
25. Fasting Prayer : 9:30 a.m. Third Saturday
26. Holy Communion : Second Sunday Services
27. Youth / Kid Prayer : 10.00 p.m. daily
28. Staff Devotion : 9.00 a.m. daily
29. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

කිතුණු ජීවිතය රෝසමල් යහනාවක් නොවනු ඇත. දේව වචනය මෙසේ පවසයි. එනම්, අපි අපිවම නොසලකා හරිමින් දිනපතාම කුරුසිය රැගෙන ගමන් කල යුතුය.

පේතෘස් සහ යොහාන් ජීවිතය වෙනස් කලාවූ හාස්කමක් කල විටදී තමාට ගෞරවය ලබාගන්නා පිණිස එය සැමරුවේ නැත. ඒ වෙනුවට ඔවුන්ට සිරගත වීමට සිදුවිය. මාගේ ප්‍රිය මිත්‍රවරුනි, දෙවියන්වහන්සේගේ සැලැස්ම අපගේ ජීවිතයේ ඉටුවීමට බාධා කරන පිණිස යක්ෂයා නොයෙක් ආකාරයෙන් පරීක්ෂාවන් ගෙනෙමින් අපට බාධා ගෙනෙනු ඇත. කෙසේ වෙතත් වෙනත් කිසි මනුෂ්‍යයෙකුටවත් කිසිම බලතලයකටවත් අප කෙරෙහි මනුෂ්‍යයෙකුටවත් කිසිම බලතලයකටවත් අප කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම වෙනස් කිරීමට නොහැකිය.

පේතෘස් සහ යොහාන්ව යේසුස් වහන්සේගේ නාමයෙන් කථා නොකරන්නය කියා අණ කරනු ලැබීය. නමුත් මේ කිසි දෙයකට ඔවුන්ව නතර කිරීමට හැකියාවක් ලැබුනේ නැත.

මගේ ප්‍රිය මිත්‍රවරුනි, අපගේ ඇදහිල්ල අප ක්‍රියාවට දමන විටදි අපට බොහෝ ප්‍රශ්න හා අභියෝගයන් වලට මුහුණ දීමට සිදුවෙනු ඇත. නමුත් අප අපගේ ඇදහිල්ල තුළ ස්ථිරව සිටිය යුතුය. අපගේ ක්‍රියාවන්ට ප්‍රතිඵල ඇත්තේ ස්වර්ග රාජ්‍යයෙහිය. එම නිසා අප අපගේ කැඳවීමට විශ්වාසවන්තව සිටිය යුතුය. අප නැවතී ආපසු හැරී නොබලා ඉදිරිය දෙස බලා ගමන් කල යුතුය.

RNI NO. TN/SIH/2006/17846

ක්‍රියා 14:22 හි මෙසේ පවසයි. ***''අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට බොහෝ දුක් විඳිමින් ඇතුල්වෙන්ට ඕනෑයි කියා ගෝලයින්ගේ සිත් සවිකොට, ඇදහිල්លේ පවතින්ට ඔවුන්ට අවවාදකලෝය.''***

ගීතාවලිය 34:19 මෙසේ පවසයි. ''ධර්මිෂ්ඨයාට පීඩා බොහෝය. නුමුත් ස්වාමීන්වහන්සේ ඒ සියල්ලෙන් ඔහු ගළවනසේක.''

ඇදහිල්ලෙන් ජීවත් වුනාවූ සියලු දෙනාම පරීක්ෂා හා කරදර වලට මුහුණදුන් බව දේව වචනය තුල අපට දැකීමට හැකිය. කිතුණුවන් හා කිතුණු නොවන්නාවූ යන සියලු දෙනාගේම ජීවිත වලට ප්‍රශ්න පැමිණෙනු ඇත. සභාවට යන අයගේ සහ සභාවට නොයන අයගේ ජීවිත වලට එක ලෙසම ප්‍රශ්න පැමිණෙනු ඇත. නමුත් මෙහි ඇති වෙනස නම් දෙවියන්වහන්සේගේ දරුවෙක් ප්‍රශ්න හා කරදර වලට, සෝදිසි වලට මුහුණ දෙන විටදී දෙවියන්වහන්සේ ඔවුන් ගැන හොඳාකාරයෙන් දන්නා නිසා දෙවියන්වහන්සේගේ සුරැකුම් දෑතේ සිටින බව ඔවුන් හොඳාකාරයෙන් දනී.

ඔබ සිටින්නාවූ තත්වය කුමක් වූවත් ඔබ සිටින්නේ තනියම නොවේය. දෙවියන්වහන්සේ ඔබ ගැන සලකයි. උන්වහන්සේ ඔබ සමග සිටී. ඔබගේ සෑම ප්‍රශ්න, කරදර හා අභියෝග මධ්‍යයේ ස්වාමීන්වහන්සේ ඔබ සමඟ සිටින නිසා අද දවසේ ඔබගේ සුවිශේෂී ඇදහිල්ල ක්‍රියාවට දමන්න.

*******

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 3rd OCTOBER 2023.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**